ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

# පුවත්පත් නිවේදනය

## <u>මහ කොමසාරිස්තුමා සහ අධ්‍යාපන අමාත්‍යතුමා කොළඹ දී ලෝක හින්දි දින සැමරුම් සමාරම්භ කරති</u>

කොළඹ ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලයේ සංස්කෘතික අංශය වන ස්වාමි විවේකානන්ද සංස්කෘතික මධ්‍යස්ථානය සංවිධානය කළ ලෝක හින්දි දින වැඩසටහනක් 2024 ජනවාරි 10-11 දිනවල කොළඹ දී පැවැත්විණ. ශ්‍රී ලංකා පදනම් ආයතනයේ පැවති මෙම දෙදින වැඩසටහන ස්වාමි විවේකානන්ද සංස්කෘතික මධ්‍යස්ථානය විසින් කැළණිය විශ්ව විද්‍යාලය, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය, රජරට විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකා සෞන්දර්ය කලා විශ්ව විද්‍යාලය සහ ඉන්දියාවේ කර්මා දේවි අනුස්මරණ විද්‍යාලය හා එක්ව සංවිධානය කර තිබිණ.

2. මහ කොමසාරිස් ශ්‍රී සන්තෝෂ් ජා මහතා ජනවාරි 10 වන දින ලෝක හින්දි දින වැඩසටහන සමාරම්භ කළ අතර අධ්‍යාපන අමාත්‍ය ආචාර්ය සුසිල් ප්‍රේමජයන්ත මහතා ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස සහභාගී විය. අධ්‍යාපන රාජ්‍ය අමාත්‍ය ඒ. අරවින්ද් කුමාර් මහාතා ගෞරවනීය අමුත්තා ලෙස සහභාගී විය.

3. සමාරම්භක දේශනය සිදු කරමින් මහ කොමසාරිස්තුමා ජාත්‍යන්තර භාෂාවක් වශයෙන් හින්දි භාෂාවේ වැදගත්කම ඉහළ යමින් තිබෙන බව සඳහන් කළේය. වර්තමානය වන විට හින්දි භාෂාව ලොව තෙවනුවට වැඩිම පිරිසක් විසින් කතා කරන භාෂාව වේ. ගෝලීය වශයෙන් හින්දි භාෂාව කතා කරන පිරිස මිලියන 600ක් පමණ වේ. එසේම එතුමා හින්දි භාෂාව ප්‍රවර්ධනය කිරීම සඳහා ස්වාමි විවේකානන්ද සංස්කෘතික මධ්‍යස්ථානය විසින් පසුගිය වසර තුළ ක්‍රියාත්මක කරන ලද විවිධ වැඩසටහන් ද සිහිපත් කළේය. හින්දි භාෂාව ඉගෙන ගන්නා සිසු සිසුවියන් හට ඉන්දියාවේ අධ්‍යාපනය හැදෑරීම සඳහා ශිෂ්‍යත්ව ලබා දීම සහ මහාචාර්යවරුන්ගේ සහ පාසල් ගුරුවරුන්ගේ හින්දි භාෂා දැනුම වර්ධනය කිරීම වැනි පියවර මේ අතර වේ. ශ්‍රී ලංකාවේ හින්දි භාෂා ආයතන සහ විද්වතුන් අගය කළ මහ කොමසාරිස්තුමා

හින්දි භාෂාව වැළඳගැනීම සම්බන්ධයෙන් ඔවුන්ට ප්‍රශංසා කළ අතර වැඩසටහන සඳහා සහයෝගය ලබා දීම සම්බන්ධයෙන් ඔවුන්ට සිය ස්තුතිය පුද කළේය.

4. හින්දි භාෂා විද්වතුන් 25 දෙනෙකුගේ සහභාගීත්වයෙන් පැවති සාකච්ඡා තුනක පත්‍රිකා ඉදිරිපත් කිරීම වැඩසටහනේ පළමු දිනයේ දී පැවැත්විණ. හින්දි සාහිත්‍යය සඳහා බුදු දහමේ බලපෑම සහ ශ්‍රී ලංකාවේ හින්දි භාෂාවේ ජනප්‍රියතාවය වැනි මාතෘකා ඔස්සේ මෙම සාකච්ඡා පැවැත්විණ. විද්වතුන් සහ ශිෂ්‍ය ශිෂ්‍යාවන් 200කට අධික පිරිසක් පළමු දිනය සඳහා සහභාගී වූහ. දෙවන දිනයේ ප්‍රධාන ආරාධිත අමුත්තා වශයෙන් නියෝජ්‍ය මහ කොමසාරිස් ආචාර්ය සත්‍යංජල් පාණ්ඩේ මහතා සහභාගී වූ අතර එහිදී හින්දි භාෂාව ඉගෙන ගන්නා සිසු සිසුවියන් විසින් පර්යේෂණ පත්‍රිකා 20කට ආසන්න ප්‍රමාණයක් ඉදිරිපත් කරනු ලැබීය. ඉන්දීය රජයේ හින්දි භාෂා මධ්‍යස්ථානය විසින් සංවිධානය කරන ලද හින්දි විභාගයේ සුදුසුකම් ලැබීමේ සහතිකපත් ද මෙහිදී ශ්‍රී ලංකාවේ සිසු සිසුවියන්ට බෙදා දෙනු ලැබීය.

5. 1949 වසරේ එක්සත් ජාතීන්ගේ මහ මණ්ඩලයේ දී ප්‍රථම වරට හින්දි භාෂාව කතා කිරීම අනුස්මරණය කරමින් සෑම වසරකම ජනවාරි 10 වන දින ලෝක හින්දි දිනය සමරනු ලැබේ. ප්‍රථම ලෝක හින්දි සමුළුව පවත්වනු ලැබුයේ 1975 වසරේ මෙවැනි දිනකදීය. ශ්‍රී ලංකාවේ පාසල් 88ක සහ රාජ්‍ය විශ්ව විද්‍යාල 7ක හින්දි භාෂාව විදේශ භාෂාවක් ලෙස උගන්වනු ලැබේ.

***

***2024 ජනවාරි 10***
***කොළඹ***